මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2023 මැයි 09 |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතන වල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2022 නොවැම්බර් 17 දින සිට 2023 මාර්තු 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ පරිපාලනමය දණ්ඩන පැනවීම/එකතු කිරීම**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19 (1) සහ 19 (2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව, එම පනතේ ප්‍රතිපාදනවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කරන ආයතන සඳහා මූල්‍යමය දණ්ඩන පනවනු ලැබේ. මූල්‍ය ආයතනයක් විසින් සිදුකරනු ලබන අදාළ අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බරපතලකම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2022 නොවැම්බර් 17 දින සිට 2023 මාර්තු 31 දින දක්වා කාලය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කර ගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන 5.5 කි. දණ්ඩන මගින් එකතු කරන ලද මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

## 1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | : | **2023 පෙබරවාරි 21** |
| **වටිනාකම (රුපියල්)** | : | **500,000.00 (රුපියල් ලක්ෂ පහකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | : | **2023 මාර්තු 21** |

**දණ්ඩනය පැනවීමට හේතුව :**

උකස් වෙන්දේසි ගැනුම්කරුවන් සඳහා පාරිභෝගිකයන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සම්බාධක වලට අදාල පිරික්සුම් කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තීන්ට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. ව්‍යාපාර සම්බන්ධතාවයක් ආරම්භ කරන අවස්ථාවේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් ලැයිස්තුවට එරෙහිව ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීමට, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද සියලුම පුද්ගලයන්ගේ සහ ආයතන වල සම්පූර්ණ ලැයිස්තුවක් පවත්වාගෙන යාමට සහ අදාල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නිකුත් කර ඇති නම් කරන ලද පුද්ගලයන්ගේ සහ

ආයතනවල ලැයිස්තුවක් යාවත්කාලීන වන අවස්ථාවකදී, එම නම් කරන ලද පුද්ගලයන් සහ ආයතන සමග ව්‍යාපාර සම්බන්ධතා නොපවත්වන බවට සහතික වීම සඳහා තම ආයතනයේ පවත්නා ගනුදෙනුකාර පදනම හෝ පවතින ව්‍යාපාරික සම්බන්ධතා පිරික්සීමට අවශ්‍ය කිසිදු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට බැංකුව අපොහොසත් වී ඇත. පද්ධති සහ ක්‍රියා පටිපාටිවල අඩුපාඩු නිරීක්ෂණය වුවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් නම් කරන ලද පුද්ගලයින් හෝ ආයතන සමඟ පවත්වාගෙන යන ව්‍යාපාරික සබඳතා පිළිබඳ අවස්ථා අනාවරණය නොවීය. තවද, 2022 මැයි 28 දින පැවති උකස් වෙන්දේසියේ ගැණුම්කරුවෙකු සම්බන්ධයෙන් පාරිභෝගිකයන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීමට සහ හඳුනාගැනීමේ ලේඛනයේ පිටපතක් ලබා ගැනීමට ද බැංකුව අපොහොසත් වී ඇත.

## 2. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2023 පෙබරවාරි 21** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2023 මාර්තු 21** |

**දණ්ඩනය පැනවීමට හේතුව :**

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සම්බාධක වලට අදාල පිරික්සුම් කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධයෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තීන්ට සහ 2016 අංක 6 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. ව්‍යාපාර සම්බන්ධතාවයක් ආරම්භ කරන අවස්ථාවේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් ලැයිස්තුවට එරෙහිව ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීමට, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද සියලුම පුද්ගලයන්ගේ සහ ආයතන වල සම්පූර්ණ ලැයිස්තුවක් පවත්වාගෙන යාමට සහ අදාල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නිකුත් කර ඇති නම් කරන ලද පුද්ගලයන්ගේ සහ ආයතනවල ලැයිස්තුවක් යාවත්කාලීන වන අවස්ථාවකදී, එම නම් කරන ලද පුද්ගලයන් සහ ආයතන සමග ව්‍යාපාර සම්බන්ධතා නොපවත්වන බවට සහතික වීම සඳහා තම ආයතනයේ පවත්නා ගනුදෙනුකාර පදනම හෝ පවතින ව්‍යාපාරික සම්බන්ධතා පිරික්සීමට අවශ්‍ය කිසිදු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට බැංකුව අපොහොසත් වී ඇත. පද්ධති සහ ක්‍රියා පටිපාටිවල අඩුපාඩු නිරීක්ෂණය වුවද, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් නම් කරන ලද පුද්ගලයින් හෝ ආයතන සමඟ පවත්වාගෙන යන ව්‍යාපාරික සබඳතා පිළිබඳ අවස්ථා අනාවරණය නොවීය. තවද, රුපියල් මිලියනයක් ඉක්මවන උකස් සහ උකස් වෙන්දේසි ගනුදෙනු වාර්තා කිරීමට ද බැංකුව අපොහොසත් වී ඇත.

**3. සෙලාන් බැංකුව**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | : | **2023 පෙබරවාරි 21** |
| **වටිනාකම (රුපියල්)** | : | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | : | **2023 මාර්තු 21** |

**දණ්ඩනය පැනවීමට හේතුව** :

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සම්බාධක වලට අදාල පිරික්සුම් කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් සමග ව්‍යාපාර සම්බන්ධතා නොපවත්වන බවට සහතික වීම සඳහා, ව්‍යාපාරික සබඳතාවයක් ගොඩනගා ගන්නා අවස්ථාවේදී සහ ආයතනයේ පවත්නා මුළු ගනුදෙනුකාර පදනම අදාල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් ලැයිස්තුවට එරෙහිව පිරික්සීමට අපොහොසත් වීම නිසා සෙලාන් බැංකුව විසින් 2012 අංක 1 දරණ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයෙකු (බාලවයස්කාර ගිණුමක භාරකරු) සමග ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථාවක් නිරීක්ෂණය විය.

**4. සම්පත් බැංකුව**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | : | **2023 පෙබරවාරි 23** |
| **වටිනාකම (රුපියල්)** | : | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | : | **2023 මාර්තු 09** |

**දණ්ඩනය පැනවීමට හේතුව** :

අඛණ්ඩව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධයෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තීන්ට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. ගිණුම් හතරකට අදාලව ගනුදෙනු ක්‍රම හඳුනා ගැනීමට, පාරිභෝගික පැතිකඩෙන් බැහැර වූ ආදායම් මූලාශ්‍ර සත්‍යාපනය කිරීමට සහ සැක කටයුතු ගනුදෙනු පිළිබද වාර්තා කිරීමට බැංකුව අපොහොසත් වී ඇත.

**5.** හැටන් නැෂනල් බැංකුව

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2023 පෙබරවාරි 23** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2023 මාර්තු 09** |

**දණ්ඩනය පැනවීමට හේතුව :**

අඛණ්ඩව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධයෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තීන්ට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. එක් ගිණුමකට අදාලව ගනුදෙනු ක්‍රම හඳුනා ගැනීමට, පාරිභෝගික පැතිකඩෙන් බැහැර වූ ආදායම් මූලාශ්‍ර සත්‍යාපනය කිරීමට සහ සැක කටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීමට බැංකුව අපොහොසත් වී ඇත.

**6.** මහජන බැංකුව

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2023 පෙබරවාරි 23** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2023 මාර්තු 07** |

**දණ්ඩනය පැනවීමට හේතුව :**

අඛණ්ඩව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධයෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්තීන්ට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. එක් ගිණුමකට අදාලව ගනුදෙනු ක්‍රම හඳුනා ගැනීමට, පාරිභෝගික පැතිකඩෙන් බැහැර වූ ආදායම් මූලාශ්‍ර සත්‍යාපනය කිරීමට සහ සැක කටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීමට බැංකුව අපොහොසත් වී ඇත.